ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව
இலங்கை சட்ட உதவி ஆணைக்குழு
Legal Aid Commission of Sri Lanka

# වැඩිහිටි අයිතිවාසිකම්



USAID/CORE ව්‍යාපෘතියේ ආධාර මත සකසන ලදී

USAID
FROM THE AMERICAN PEOPLE

USAID
FROM THE AMERICAN PEOPLE

## වගකීමෙන් මිදීමේ ප්‍රකාශය

"අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකානු නියෝජිතායතනයේ (USAID) හරහා ලැබෙන ඇමරිකානු ජනතාවගේ පරිත්‍යාගශීලීත්වය මත මෙම ප්‍රකාශනය එළි දැක්වේ. මෙම වාර්තාවේ අන්තර්ගතය පිළිබඳ සම්පූර්ණ වගකීම ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව සතුවන අතර එමඟින් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකානු නියෝජිතායතනයෙහි (USAID) හෝ ඇමෙරිකානු එක්සත් ජනපද රජයේ මතය කිසිඳු අයුරකින් පිළිබිඹු නොවන බව සැලකුව මැනව."

Ministry of Justice

# වැඩිහිටි අයිතිවාසිකම්

**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව**


සම්පාදනය

නීතිඥ එම්.එම්.පියුමි කුමාරි සමරසිංහ, LLB


*copyrights@ Legal Aid Commission of Sri Lanka*



## සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව (1978) අංක (27)දරණ පනත මඟින් ස්ථාපිත කරන ලදී. වරප්‍රසාද නොලත් ප්‍රජාවන්ට නොමිලේ නීතිමය උපදෙස් ලබාදෙන අරමුණින් ව්‍යාවස්ථාපිත නීති ආයතනයක් ලෙස කොමිසම මානව හිමිකම්, ළමා අයිතිවාසිකම්, කාන්තා අයිතිවාසිකම්, වැඩිහිටි අයිතිවාසිකම්, පවුල් නීතිය, කම්කරු නීතිය, වැනි ක්ෂේත්‍ර කිහිපයක නීතිමය සහය ලබාදෙයි. හැකිතාක් සිවිල් නීතියේ සහන සැලසීමට, දැනුවත් කිරීමට සහ මඟපෙන්වීම සඳහා අපගේ ආධාර පුළුල් කර ඇත්තෙමු.

අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන බොහෝ සංවිධාන තිබුනත්, ශ්‍රී ලංකා රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස නීතිමය කටයුතු කරගෙන යාමට නීතිමය බලය ඇති එකම ආයතනය නීති ආධාර කොමිෂන් සභාවයි.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව ආදායම, සමාජ තත්වය, ජාතිය, ආගම, ස්ත්‍රී පුරුෂ භාවය හෝ වයස නොසලකා උපදෙස් ලබා දෙයි. පීඩිත සහ අවදානමට ලක්ව ඇති දිවයින පුරා විසිරී සිටින දහස් ගණනකට නීතියේ පිහිට සමානව ලබාදීම ගැන අප ආඩම්බර වෙමු.

මෙම පොත් එකතුව ප්‍රජාවන්ට, නිලධාරින්ට සහ පුද්ගලයන්ට නීතිය අවබෝධ කර ගැනීමටත්, ඔවුන් ගේ අයිතිවාසිකම් සහ යුතුකම් පිළිබඳව දැනුවත් වීමටත් අත්වැලක් වේ. තව දුරටත් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ නිලධාරීන් මඟින් අවශ්‍ය නීතිමය සහය සහ උපදෙස් ලබා ගත හැකි බව දැනුවත් වීමට මෙය උපකාර වනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

**ජනාධිපති නීතිඥ රොහාන් සහබන්දු**
සභාපති, ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

# ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව (1978) අංක (27) දරණ පනත මඟින් ස්ථාපිත කරන ලදී. එමඟින් අවදානමට ලක් විය හැකි, අඟහිඟකම් ඇති ප්‍රජාවන්ට, සමාජ තත්වයෙන් හෝ ආර්ථික තත්වයෙන් හෝ ස්ත්‍රී පුරුෂ භාවය අනුව යුක්තිය සඳහා ප්‍රවේශ වීම සීමා වී ඇති පුද්ගලයින්ට නීති ආධාර සැපයීම උදෙසා පිහිටුවන ලද්දකි.

තිරසාරභාවය හා ස්ථාවරත්වය උදෙසා නීතිමය ආධාර සපයන වෙනත් ආයතන හා සංවිධාන අතරින් මෙම කොමිසන් සභාව ප්‍රමුඛස්ථානයක් ගනී.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව දිවයින පුරා පළාත් 9 ක මධ්‍යස්ථාන 84 පවත්වා ගෙනයන අතර දැනුවත් කිරීම සහ ආදයම් සීමාවකින් තොරව සියලුම දෙනාට නීති උපදෙස් සම්පාදන ලබා දීම පිළිබඳව අවබෝධ කිරීම් සිදුකරයි. එහි ස්ථීර නීතිඥයින් 120ට අධික සංඛ්‍යාවක් සහ නිදහස් වෘත්තීක නීතිඥයන් 1000 ට අධික සංඛ්‍යාවක් කාර්යයේ නිරත වේ.

"කොමිෂන් සභාවේ දැක්ම වන්නේ සියලුම ශ්‍රී ලාංකිකයන්ට යුක්තිය සඳහා සමාන ප්‍රවේශයක් තිබිය යුතු සමාජයක් නිර්මාණය කිරීමයි." මෙම අරමුණ සාක්ෂාත්කර ගැනීම සඳහා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව බොහෝ ව්‍යාපෘති සිදුකර ඇත.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ මෙහෙවර වන්නේ රටේ නීතිමය පිහිට ලැබිය යුතු පුද්ගලයන්ට පිහිට ආධාර ලබාදීම බව පනතේ සඳහන් වේ.


## අපගේ දැක්ම

### යුක්තියට සම ප්‍රවේශයක්

ශ්‍රී ලාංකිකයින්ට ඔවුන්ගේ ආර්ථික හෝ සමාජ තත්වය, ස්ත්‍රී පුරුෂ භාවය, කුලය, ආගම හෝ ජාතිකත්වය හෝ ආබාධිතභාවය නොසලකා යුක්තිය සඳහා සමාන ප්‍රවේශයක් ඇති සමාජයක් නිර්මාණය කිරීමයි.

# පටුන


| | පිටු අංක |
|---|---|
| වැඩිහිටියා යනු කවරෙක්ද ? | 01 |
| වැඩිහිටි නීතිය යනු කුමක්ද ? | 02 |
| වැඩිහිටි නීති ඉතිහාසය | 03 |
| වැඩිහිටියන් මුහුණපාන නීතමය ගැටලු මොනවාද ? | 04 |
| අයිතිවාසිකම පිළිබඳ නොදැන සිටීම සහ නොසලකා හැරීම | 05 |
| වැඩිහිටියන් විශේෂයෙන් දැනුවත් විය යුතු නීතිමය කරුණු | 07 |
| 2000 අංක 09 දරණ පනතින් රැකදෙන වැඩිහිටි අයිතිවාසිකම් | 08 |
| මෙම මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය කෙසේද ? | 09 |
| නීති ආධාර කොමිෂන් සභාව මගින් වැඩිහිටියන් වෙනුවෙන් සිදු කරනු ලබන සේවාවන් | 10 |
| අකෘති පත්‍රය | 12 |
| වැඩිහිටි උපකාරක සේවා ආයතන | 14 |
| LAC මධ්‍යස්ථාන පිහිටි ස්ථාන | 15 |




## වැඩිහිටියා යනු කවරෙක්ද?

> “ වැඩිහිටි නීතිය අනුව වැඩිහිටියකු වශයෙන් සලකනු ලබන්නේ වයස අවුරුදු 60 ඉක්ම වූ අයයි. ”

වැඩිහිටියා යනු වයසින් මෙන්ම අත්දැකීමෙන්ද සමාජයේ ඉදිරියෙන් සිටින පිරිසයි. වැඩිහිටි නීතියට අනුව වැඩිහිටියකු වශයෙන් සලකනු ලබන්නේ වයස අවුරුදු 60 ඉක්මවූ අයයි. ශ්‍රී ලංකාවේ ජනග්‍රහණ--යෙන් මිලියන 2.3 කට වැඩි පිරිසක් දැනට සිටින්නේ මෙම වයස් සීමවා තුළය. එමෙන්ම එම ප්‍රමාණය ඉදිරියේදී තව තවත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

# වැඩිහිටි නීතිය යනු කුමක්ද ?

වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරදීම සඳහා 2000 වර්ෂයේදී සම්මත කරගත් නීතිය වැඩිහිටි නීතිය ලෙස හැඳින්වේ. එම නීතිය ඇතුලත් වන්නේ 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේය. එබැවින් අවුරුදු 60 ට වැඩි සියළුම පුරවැසියන් සුරක්ෂිත කරයි.



# වැඩිහිටි නීතියේ ඉතිහාසය

ශ්‍රී ලංකාවේ පවතින නීතීන් පිළිබඳ කල්පනා කර බලන විට සමාජයේ ආරක්‍ෂාව හිමිවිය යුතු කණ්ඩායම් වශයෙන් සැලකෙන ළමුන්, කාන්තාවන්, ශාරීරික සහ මානසික නොහැකියාවන්ගෙන් පෙළෙන්නන් ආදී කොටස් ආරක්‍ෂා කිරීමට නොයෙකුත් නීති සම්පාදනය වී තිබෙනවා.

එහෙත් ඒ පරිද්දෙන්ම ආරක්‍ෂාව හිමි විය යුතු වැඩිහිටියන් සඳහා බොහෝ කාලයක් තිස්සේ විශේෂ නීතියක් ශ්‍රී ලංකාවේ සම්මත වී නොතිබුණි. ජාත්‍යන්තරව පවා වැඩිහිටියන් සම්බන්ධයෙන් අනුගමනය කල යුතු ප්‍රතිපත්තීන් පිළිබඳ දක්වා ඇතත් වැඩිහිටියන් ආරක්‍ෂා කිරීමට බිහි වී ඇති සංවිධාන ඇත්තේ ඉතාම සුළු ප්‍රමාණයකි.

> “ වැඩිහිටියන්ගේ යහපත උදෙසා වැඩිහිටි පනත මඟින් ස්ථාපිත කරන ලද ජාතික වැඩිහිටි සභාව. ”

ශ්‍රී ලංකාවේ පවතින මෙම අඩුපාඩුව සම්පූර්ණ කිරීම සඳහා 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීමේ පනත නමින් විශේෂ නීතියක් සම්පාදනය වුණි.

මෙම පනත සම්මත කිරීමේ අරමුණ වුයේ අපගේ වැඩිහිටියන්ට සිය ජීවිත කාලය පුරා අයිතිවාසිකම් සහිත ගෞරවනීය පුරවැසියන් ලෙස ජීවත් වීමට සුදුසු වාතාවරණයක් සකස් කරදීමයි. මෙම අරමුණ ඇතිව පනත මඟින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජතික සභාව නමින් විශේෂ ආයතනයක් පිහිටුවනු ලැබිණි.

**ජාතික වැඩිහිටි සභාව**

සභාවේ සභාපති (අමාත්‍යංශයේ ලේකම්වරයා)

| | | |
|---|---|---|
| සභාවේ ලේකම් (සමාජ සේවා දෙපාර්තමේන්තුව) | සංගමයේ සභාපති (සමාජ සුභසාධන අමාත්‍යාංශයේ ලේකම්) | සාමාජිකයින් (ජනාධිපතිවරායා විසින් පත්කරනු ලබයි) |

- ප්‍රධාන වශයෙන් වැඩිහිටි පාර්ශවයන් සම්බන්ධව සුභසාධන සහ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්‍ෂා කිරීමත් වැඩිහිටියන්ට ආත්ම ගරුත්වයක් හා ස්වාධීනත්වයක් ඇතිව ජීවත් වීමට අවස්ථාවක් සලසා දීමත් අරමුණු කරගනිමින් මෙම සභාව ක්‍රියාත්මක වේ. (13 වන වගන්තිය)

- ඉහත අරමුණු ඉටුකරගැනීම සඳහා මෙම පනතේ 15 වන වගන්තිය මඟින් විධිවිධාන සලස්වා ඇත. එනම් දරුවන් විසින් වියපත් දෙමව්පියන් රැකබලා ගැනීමට ඔවුන්ගේ නෛතික වගකීමක් බවටත් දරුවන් නොමැති සහ අනාථ වැඩිහිටියන් රැකගැනීම රජයේ යුතුකමක් බවටත් පත්කිරීමයි.

# වැඩිහිටියන් මුහුණපාන නීතමය ගැටලු මොනවාද ?

ඈත අතීතයේ පටන්ම වැඩිහිටියන්ට ඉහලින්ම සැලකිලිමත් ඒ අය සමාජයේ උසස් ගෞරවනීය පුද්ගලයන් සේ සැලකීමත් අපේ පුරුද්දක් විය. එහෙත් ටිකෙන් ටික ලෝකය දියුණු වනවාත් සමඟම දරුවන් හා මහලු දෙමාව්පියන් අතර තිබූ සම්බන්ධකම් ඈත් වී ඇත.

දරුවන්ට රැකවරණයක් නොමැතිකම

නවාතැන් පහසුකම් නොමැති වීම

දේපල අහිමි වීම

විශ්‍රාම වැටුප් ගෙවීම සහ නීතියෙන් හිමිකම් ඇති වෙනත් සහන නොලැබීම

අයිතිවාසිකම් නොදැන සිටීම හෝ නොසැලකිලිමත් වීම

# අයිතිවාසිකම පිළිබඳ නොදැන සිටීම සහ නොසලකා හැරීම

වැඩිහිටි වීමත් සමඟ නීතිමය අයිතිවාසිකම් ආදිය පිළිබඳ බෙහෙවින් දැනුවත් වීම ඉතා වැදගත්. බොහෝ වෙලාවට දරුවෙකුට දේපළක් පැවරීමේදී තමන්ට මිය යන තුරු බුක්ති විඳීමේ අයිතිය ඒ වාගේම තමන්ට කැමති වේලාවක අවලංගු කිරීමේ හැකියාව තමන් සතුව තබාගැනීම ඉතා වැදගත්.

## දේපළ

- තමන්ගේ දේපළකට කෙනෙක් බලෙන් ඇතුලු වෙනවා නම් හෝ පාවිච්චි කරනවා නම් ඒ සඳහා ග්‍රාම නිළධාරීන්ගේ, පොලිසියේ හෝ බලධාරී ආයතනයක සහය ලබා ගැණිම අවශ්‍ය. හැකි ඉක්මනින් පියවර ගන්නේ නම් කාලය අවසන් වූ විට උසාවියට යාමට සිදු නොවේ.

## නඩු

- වැඩිහිටි ඔබ ඉඩම් නඩුවකට පැටලී සිටිනවා නම් ඒ සම්බන්ධයෙන් අධිකරණයෙන් දුන්න තීන්දුවකට තමන් සතුටු නොවන අවස්ථාවක ඊට විරුද්ධව අභියාචන දැන්වීමක් එම අධිකරණයට දින 14ක් ඇතුළත නීතිඥවරයෙකු හරහා ඉදිරිපත් කිරීමට අමතක නොකල යුතුය. දින 14ක කාලය ගතවුවාට පසුව කළ හැකි කිසිවක් නැත. එමෙන්ම නඩුවල කාලාවරෝධී කාලය පිළිබඳ දැනුවත්ව සිටිය යුතුයි.

## අත්සන තැබීම

- එසේම වැඩිහිටියෝ කිසිම වේලාවක කවුරු කීවත් හිස් කඩදාසි වලට අත්සන් නොකළ යුතුය. නොකියවා කිසිම ලියවිල්ලකට අත්සන් කිරීම සුදුසු නොවේ. තමන්ට කියවීම අපහසු නම් විශ්වාසදායී කෙනෙකු ලවා කියවා ගත යුතුය.

- එසේම තමන් යම් ආයතනයක නිළධාරියෙකුට යම් කරුණක් සම්බන්ධයෙන් ලිපියක් ලියන හැම විටම එහි පිටපතක් තබාගැනීම ඉතා වැදගත් වේ.

## රිය අනතුරු

- රිය අනතුරකට මුහුණ දුන් වේලාවක තමන් අනතුරුට ලක්කල වාහනයේ අයිතකරුගෙන් තමන්ට සිදුකළ අලාභය වෙනුවෙන් වන්දියක් ලබාගැනීමට පොලිසිය පවරන නඩුවට අමතරව දිසා අධිකරණයේ වන්දි නඩුවක් පැවරීම අවශ්‍යවේ. එසේම එය වසර 02 ක් ගත වීමට පෙර කළ යුතුය.

## මූලික අයිතිවාසිකම්

- තමන්ගේ මූලික අයිතිවාසිකම් එනම්, රාජ්‍ය නිලධාරීන් අතින් වධ හිංසාවලට ලක් නොවීම, සමානාත්මතාවෙන් සැලකීමේ අයිතිය, කැමති ආගමක් ඇදහීමේ, කැමති ප්‍රදේශය ජීවත්වීමට, සමිති සමාගම්වල යෙදීමේ වැනි අයිතීන් කඩ වූ අවස්ථාවක එම සිද්ධියෙන් දින 30 ක කාලය ඉක්ම වීමට කලින් ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් වයස් භේදයකින් තොරව සැමදෙනාටම හිමි විය යුතු දේවල්යි

එමෙන්ම, එම කරුණු පිළිබඳ දැනුවත් වී සිටීම වැඩිහිටියන්ට ජීවිතයේ ඕනෑම අවස්ථාවක ප්‍රයෝජනවත් විය හැකිය.



# වැඩිහිටියන් විශේෂයෙන් දැනුවත් විය යුතු නීතිමය කරුණු

## දේපළ පැවරීම

වැඩිහිටියන් බොහෝ අවස්ථාවලදී අසරණභාවයට පත්වන්නේ දරුවන්ට තම දේපළ පවරාදීමත් සමඟය. එබැවින් මෙය ඉතාමත් ඥානාන්විත ආකාරයට සිදුකල යුතුය. බොහෝ අවස්ථාවලදී අපගේ වැඩිහිටි දෙමපියෝ තමන්ගේ මරණයට මත්තෙන් තමා සතුව පවතින ඉඩකඩම් සහ අනෙකුත් දේපළ සහ වස්තුව සිය දරුවන්ට තෑගිදීම සිදු කරුනු ලබති. මෙම ත්‍යාග දීමනා පත්‍ර සකස් කිරීමේදී වැඩිහිටියන් විසින් පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වීම ඉතා වැදගත්.

- අවම වශයෙන් තමාගේ සහ තම අනෙක් විවාහක පාර්ශවය (බිරිඳ /සැමියා) ජීවත්ව සිටිනම් ඔහුගේ හෝ ඇයගේ ජීවත් බුක්තියට ද යටත්ව එම දේපළ බැහැර කිරීම වැදගත්ය. එවැනි විටක අඩු තරමින් ජීවත් වන කලාය තුරාම එම දේපළ බුක්ති විදීමේ හැකියාව සුරක්ෂිත වේ.
- එසේම අවශ්‍ය නම් කැමති අවස්ථාවක එම දේපළ අවලංගු කිරීමේ අයිතිය තමන් වෙතම රඳවාගෙන වුවද දේපළ ප්‍රදානය කිරීමේ හැකියාව ද ඇත.
- තමාගේ මරණයට කලින් දේපළ පැවරීමට අදහස් කරන්නේ නම් සියලු දරුවන්ට සමාන ආකාරයට එම පැවරීම සිදු කිරීමෙන් බොහෝ ගැටළු සහගත තත්ත්වයන් මඟහරවා ගත හැක.
- තමාගේ මරණින් පසුව, දේපළ අභිමත අයුරින් පැවරීමට අදහස් කරන්නේ නම් අන්තිම කැමති පත්‍රයක් මාර්ගයෙන් දේපළ පැවරීම සිදුකළ හැකිය.තමන්ට අවශ්‍ය ඕනෑම අවස්ථාවක එම අන්තිම කැමති පත්‍රය අවලංගු කොට අලුත් අන්තිම කැමති පත්‍රයක් සකස් කර ගැනීම සිදුකල හැකිය.

## නොදන්නා ලේඛන වලට අත්සන් නොකර සිටීම

අපගේ වැඩිහිටියන් බොහෝ අවස්ථාවල හිස් කඩදාසි වලට අත්සන් තැබීම, කියවා නොබලා ලේඛන වලට අත්සන් තැබීම වැනි නොසැලකිලිමත් ක්‍රියාවන් සිදු කිරීමේන්ද තමාගේ දේපළ අහිමි කර ගන්නා අතර ඉතා විශාල අලාභ හානි වලටද මුහුණ දෙනු ඇත. එබැවින් කිසිදු අවස්ථාවකදී තමාගේ අත්සන හෝ ඇඟිලි සලකුණ හිස් කොළයකට හෝ නොදන්නා ලේඛණයකට නොදිය යුතුය.

## අයිතවාසිකම් පිළිබඳ දැනුවත් වීම සහ ක්‍රියාත්මක වීම

වැඩිහිටියන් නීතිය සම්බන්ධයෙන් මෙන්ම අයිතිවාසිකම් පිළිබඳවද දැනුවත් වී සිටීම ඉතා වැදගත්. විශේෂයෙන් සිය අයිතිවාසිකම් උල්ලංඝනය සිදුවූ අවස්ථාවකදී ක්‍රියාත්මක විය යුතු කාලසීමාව (කාලාවරෝධය) පිළිබඳ දැනුවත් වීමා ඉතා වැදගත්ය.

උදා :- රිය අනතුරක් සිදුවූ අවස්ථාවල ඊට අදාල වන්දි නඩුව අනතුර සිදු වූ ප්‍රදේශයේ දිසා අධිකරණයේ එම අනතුර සිදු වී වසර 2ක් ගතවීමට මත්තෙන් පැවරිය යුතුය.

මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමකදී එවැනි නඩුවක් ශ්‍රේෂ්ඨාධිකරණයේ මාසයක් ඇතුළත ගොනු කළ යුතුය.

# 2000 අංක 09 දරණ පනතින් රැකදෙන වැඩිහිටි අයිතිවාසිකම්

**දරුවන්ගෙන් නඩත්තු ලබාගැනීම**

තමන්ගේ මහළු දෙමාව්පියන් නඩත්තු කිරීම අපේ රටේ අමුතුවෙන් නීති පොත්වලට ඇතුලු කල යුතු දෙයක් නොවේ. කෙසේ නමුත් අද වන විට සමාජයට මෙම ගුණදර්ම අලුතින් මතක් කර දීමට සිදුවී තිබේ. යුතුකමක් හැටියට පමණක් පවතින විට ඒවා පැහැර හැරීමටත් හැකියාවක් තිබෙන බැවින් නීතිය මඟින් වැඩිහිටියන්ගේ යහපත පිණිස මෙය නීතිමය බැඳීමක් බවට පත් කර තිබේ. එමෙන්ම දරුවන් නොමැති හෝ අනාථ වූ හෝ වැඩිහිටියෙකු රැකබලාගැනීම රජයේ යුතුකමක් ලෙසට පහත සඳහන් කර තිබේ. (15 වන වගන්තිය)

## ඒ අනුව වැඩිහිටි දෙමාපියෙකුට

තමාට ජීවත්වීමට හරිහැටි ආදායමක් නැතිනම් තමන්ගේ හැකියාව ඇති දරුවන්ගෙන් නඩත්තු ලබාගැනීමට අයිතිවාසිකමක් ඇත. අපේ රටේ දෙමාපියන් දරුවන් තමන්ට කෙතරම් නොසලකා හැරියත් ඒ අයව උසාවි වලට හෝ පොලීසි වෙත ගෙන එමට අකමැතිකම හේතුවෙන් පනතින් එයට ඉතාම සුදුසු පියවරක් යොදා තිබේ. එනම් උසාවියක් නොවන එහෙත් උසාවියක් හා සමාන බලයක් තිබෙන ආයතනයක් වැඩිහිටියන් වෙනුවෙන්ම පමණක් පිහිටුවා ඇත. මෙම ආයතනය වැඩිහිටි නඩත්තු ඉල්ලීම් මණ්ඩලය ලෙස නම් කොට තිබේ. එමඟින් වෙනත් අධිකරණ වල කටයුතු මෙන් සෑම දෙනාටම දැකගත හැකිවන ආකාරයට නොවේ. රහස්‍යතාවය රැකෙන විදිහට එහි කටයුතු සිදුවන්නේ ඒ නිසා කිසිවකුටත් එමඟින් අපහසුතාවයක් ඇති වීමක් නොමැත.

## වැඩිහිටි නීතියට අනුව නඩත්තු ලබාගත හැක්කේ කාගෙන්ද ?

වැඩිහිටි නීතියට අනුව වියපත් මවකට හෝ පියෙකුට තමාගේම දරුවෙකුගෙන් මෙන්ම තමන් විසින් හදාවඩාගත් දරුවෙකුගෙන් වුවද නඩත්තු මුදල් ලබා ගත හැක. එසේම නඩත්තු ඉල්ලීම එක් දරුවෙකුට එරෙහිව හෝ දරුවන් කීප දෙනෙකුට එරෙහිව වුවද කළ හැක.

## වැඩිහිටි නීතියට අනුව නඩත්තු ඉල්ලීමක් කළ හැක්කේ කාහටද ?

දරුවන් එක් අයෙක් හෝ වැඩි ගණනක් සිටියදීත් ස්වකීය නඩත්තුව තමා විසින්ම සපයා ගත නොහැකි වැඩිහිටි දෙමාපියෙකුට නඩත්තු ඉල්ලීමක් මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කළ හැක.

## මෙම මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය කෙසේද ?

ප්‍රාදේශීය මට්ටමින් ව්‍යාප්තව ඇති සමථ මණ්ඩලය මෙන් සුහද ආකාරයෙන් අවසන් නිගමනයක් කර එළඹෙන මෙම ක්‍රමය යටතේ පාර්ශවයන් අතර එදිරිවාදිකම් ඇති වීමට අවස්ථාවක් ඇති නොකෙරේ. මේ නිසා සතුටින් රැස්ව සතුටින් විසිර යාම වැනි අධිකරණ ක්‍රියාවලියක දැකිය නොහැකි සුවිශේෂ ලක්‍ෂණ මෙම වැඩිහිටි ක්‍රියාවලිය තුල දක්නට ඇත.

කෙසේ වෙතත් යමෙක් මෙම සාමාජිකයින්ට අපහාස වන පරිදි කටයුතු කරනවා නම් හෝ එහි කටයුතුවලට බාධා කරයි නම් සාධාරණ හේතුවක් නොමැතිව මණ්ඩලය ඉදිරියේ පෙනී සිටීම මගහරියි නම් එම තැනැත්තා මණ්ඩලය අධිකාරියට එරෙහිව අපහාස කිරීම නම් වරදක් සිදුකරන අතර අධිකරණයට අපහාස කිරීම යටතේ නඩු පැවරීම කළ හැකිය.

## වැඩිහිටි ඉල්ලීම් මණ්ඩලයට තම දුක් ගැනවිල්ල ඉදිරිපත් කරන්නේ කෙසේද ?

මෙහි අවසානයට දැක්වෙන ආකෘතියේ දක්වා ඇති තොරතුරු සම්පූර්ණ කර වැඩිහිටි නඩත්තු ඉල්ලීම මණ්ඩලය වෙත හෝ ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභා මධ්‍යස්ථානයක් වෙත සිය ඉල්ලීම එවිය හැක.

වැඩිහිටි නඩත්තු ඉල්ලීම් මණ්ඩලයේ ලිපිනය

සභාපතිතුමා,
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු ඉල්ලීම් මණ්ඩලය,
ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය,
2 වන මහල ඩී කොටස
සෙත්සිරිපාය, 2 වන අදියර,
බත්තරමුල්ල.

| | |
|---|---|
| දුරකථන | : 011-2054136, 011-2054164 |
| ෆැක්ස් | : 011-2187015 |
| ඊ-මේල් | : nsemss@gmail.com |

(ආකෘති පත්‍රය අවසාන පිටුවේ දැක්වේ)

# නීති ආධාර කොමිෂන් සභාව මඟින් වැඩිහිටියන් වෙනුවෙන් සිදු කරනු ලබන සේවාවන්

## වැඩිහිටියන්ගේ නීති ගැටලු වලට නීති උපදෙස් හා නීති ආධාර ලබාදීම

වැඩිහිටියෝ ඇතැම් අවස්ථාවල මුලින් සඳහන් කලාමෙන් නීති ප්‍රශ්ණයකට මුහුණ දුන්නහොත් දරුවන්ගේ නඩත්තු ලබාගත හැක. එහෙම නැතහොත් ඉඩකඩම් ප්‍රශ්ණයකදී අවශ්‍ය උපදෙස් නොමිලේ ලබාදීමට හැක.

දරුවන් අතින් හිංසනයන්ට හෝ වෙනත් යම් අසාධාරණයන්ට ලක්වන දිළිඳු වැඩිහිටියන්ට හට නීතිමය සහනයක් ලබා දීමට උදව් උපකාර කිරීමටද නීති ආධාර කොමිෂන් සභාව ඉදිරිපත් වී ඇත.

එමෙන්ම නීති ආධාර කොමිසමට පැමිණීමට අපහසු වැඩිහිටි නිවාස හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානවල සිටින වැඩිහිටියන්හට ඔවුන් වෙතට පැමිණ ඔහුන්ගේ නීති ගැටලුවලට උපදෙස් හා අවශ්‍ය නම් නීතිඥ සහය ලබා දීමට නීති ආධාර කොමිසම විසින් කටයුතු කෙරේ. වැඩිහිටි නිවාස වල සිටින වැඩිහිටියන් හෝ ඔවුන් එකතුවී පිහිටුවාගත් සංගමයකින් හෝ නීති ආධාර කොමිෂමෙන් හෝ ඉල්ලීමක් කළහොත් එම අයට අවශ්‍ය උපදෙස් ලබාදීම සඳහා පැමිණිය හැකිය. තවදුරටත් නීති ආධාර කොමිසම වැඩිහිටියන්ගේ නීතිමය ලියකියවිලි සාදාගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදීම එම නිසා දරුවන්ට දේපළ පැවරීමක් සිදුකිරීමේදී හෝ මේ ආකාරයේ කටයුත්තකදී නිසි පරිදි උපදෙස් කටයුතු කිරීමට වැඩිහිටියන්ට හැකියාව ඇත.

වැඩිහිටියන්හට තමන්ගේ අයිතවාසිකම් පිළිබඳ දැනුවත් කිරීමටත් නීතිමය කාරණාවන් පිළිබඳ ඔවුන්ගේ දැනුම වර්ධනය කිරීමටත් විවිධ දැනුවත් කිරීමේ දේශන සම්මන්ත්‍රණ හා උපදේශන සේවාවන් ආදිය නීති ආධාර කොමිසම මඟින් ගම් මට්ටමින් දියත් කොට තිබේ.

## වැඩිහිටියන් විසින් නඩත්තු කිරීම සඳහා වන හිමිකම් තීරණය කිරීම සඳහා මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම

වැඩිහිටි තැනැත්තෙකුගේ වාසියට නඩත්තු ඉල්ලීම් මණ්ඩලය මඟින් දෙන ලද නියෝගයක් කඩ කිරීම සම්බන්ධව වැඩිහිටියන් විසින් එම මණ්ඩලයට කරන ලද පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීමේ බලය ද ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවට හිමිවේ. ඒ අනුව නඩත්තු ඉල්ලීමේ මණ්ඩලයේ සභාපතිතුමා විසින් නිකුත් කරනු ලබන නඩු පැවරීමේ සහතිකය අදාළ ප්‍රදේශයේ මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර එම නියෝගය ක්‍රියාත්මක කරගැනීම වෙනුවෙන් නීති ආධාර කොමිෂන් සභාව කටයුතු කරනු ලැබේ.

## ගම් මට්ටමින් සිදු කරන දැනුවත් කිරීමේ වැඩසටහන්

2000 අංක 09 දරණ පනතින් අපේක්ෂිත සුභසිද්ධිය ඇති කිරීමේදී ප්‍රායෝගිකව බලපාන ගැටළු පවතී. ප්‍රධාන වශයෙන් ජනතාව ඒ පිළිබඳව දැනුවත් නොවීම දැක්විය හැක. විශේෂයෙන්ම ගම්බද වැඩිහිටියන් මෙම පනත පිළිබඳව හෝ ඉන් ඉටුවන කාර්‍යන් පිළිබඳව හෝ වැඩිහිටි මණ්ඩලය මඟින් ලබාගත හැකි සහන පිළිබඳව නොදනී. මේ නිසා මෙකී තත්ත්වය පාලනය කර ජනතාව දැනුවත් කිරීම සඳහා නීති ආධාර කොමිසම මඟින් ප්‍රාදේශිය මට්ටමින් සහ ජාතික මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසහටන් දියත් කරනු ලැබේ.

එවැනි වැඩසටහන් මඟින් වැඩිහිටි පුද්ගලයන් තුළ ගිලිහී යන ආත්ම ශක්තිය පණ ගන්වා ඔවුනට සමාජමය වැදගත්කමක් ලබාදීම තවදුරටත් ස්වාධීන පුද්ගලයන් ලෙස ජීවත් වීමට අවස්ථාව සලසා දීම අපේක්ෂා කරයි. වැඩිහිටි දින සැමරුම් උත්සවය පැවැත්වීම සහ වැඩිහිටි ප්‍රාදේශීය බල මණ්ඩල ඉලක්ක කරගත් වැඩසටහන් මෙහිදී විශේෂ වේ. මෙම අරමුණ ඉටුකරගැනීමට නම් ගම් මට්ටමින්/ ප්‍රාදේශීය මට්ටමින් පවත්වන වැඩසටහන් සඳහා විවිධ වූ ක්‍රියාකාරකම් අනුගමනය කරයි.

මෙසේ පවත්වනු ලබන වැඩසටහන් වල විශේෂයෙන් වන්නේ එහිදී නීතිමය උපදෙස් සහ නීතිමය දේශන පැවැත්වීමට අමතරව වැඩිහිටියන් වෙනුවෙන් විශේෂ වූ වෙන්ත විවිධාංගයන් සිදුකිරීමයි. ඒ අනුව වැඩිහිටි කලා කුසලතාවන් ඉදිරිපත් කිරීම සභාවේ සිටින වයසින් ජ්‍යෙෂ්ඨතම වැඩිහිටියා තෝරා ත්‍යාග පිරිනැමීම වැනි ක්‍රියාකාරකම් විශේෂාංග සිදු වේ.

# අභියාචනා පත්‍රය

ලේකම්,
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය
2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ/අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 25 වන වගන්තිය යටතේ දරුවන්ගෙන් නඩත්තු ලබාගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම.

01. (අ) සහන ඉල්ලා සිටින අයගේ නම ..........................................

(ආ) වයස ..........................................

(ඇ) ස්ථිර ලිපිනය ..........................................

(ඈ) දුරකථන අංකය ..........................................

02. සහන ඉල්ලා සිටින අය දැනට පදිංචි ස්ථානය අයත්

(අ) පළාත් සභාව

..........................................

(ආ) දිස්ත්‍රික්කය

..........................................

(ඇ) ප්‍රාදේශීය සභා කොට්ඨාශය

..........................................

03. (අ) සහන ඉල්ලා සිටින අයගේ වර්තමාන මාසික ආදායම

..........................................

(ආ) එම ආදායම ලැබෙන්නේ කෙසේද?

(1) විශ්‍රාම වැටුප
(2) මහජනාධාර ආධාර
(3) බැංකු පොලී
(4) වෙනත් ..........................................

04. ඉල්ලීම කරන්නේ කුමන කරුණක් පිළිබඳවද ?

(අ) කිසියම් කෙනෙකුගෙන් වූ අසාධාරණයක් සම්බන්ධවද ?

..........................................

එසේනම් සිදුවූ අසාධාරණය කෙටියෙන් දක්වන්න

..........................................
..........................................
..........................................
..........................................
..........................................

(ආ) කිසියම් කෙනෙකුගෙන් ඉල්ලුම්කරුට ආධාරයක් / වන්දියක්/ උදව්වක්/ සැලකිල්ලක් ලැබේද ?

ඔව් / නැත
ඒ ගැන කෙටියෙන් සඳහන් කරන්න
..................................................................................................
..................................................................................................
..................................................................................................
..................................................................................................
..................................................................................................

05. මෙම ඉල්ලීමෙන් ඉල්ලුම්කරු කුමන අයගෙන් ආධාර බලාපොරොත්තු වන්නේද ?

I. සම්පූර්ණ නම ..................................................................................
II. ඥාති සම්බන්ධය..................................................................................
III. වයස ..................................................................................
IV. ලිපිනය ..................................................................................
V. රකෂාව ..................................................................................
VI. දන්නා තරමින් ඔහුගේ /ඇයගේ මාසික ආදායම ..................................
VII. දිනය ..................................................................................
VIII. ඉල්ලුම්කරුගේ අත්සන ..................................................................

මෙම කුඩා පොත්පිංච ජ්‍යේෂ්ඨ පුරවැසියන් හට, විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන වැඩිහිටියන්ට එදිනෙදා ජීවිතයේදී වැදගත්වන නීතිමය කරුණු ගණනාවක් ඉතා සරලට පහදා දීම සහ ඔවුන් දැනුවත් කණ්ඩායමක් බවට පත් කිරීම අරමුණු කොට ගෙන ප්‍රකාශ යට පත් කරන ලද්දකි.

# වැඩිහිටි උපකාරක සේවා ආයතන

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාළිගාවත්ත, කොළඹ 10, ශ්‍රී ලංකා.
0112 209 870

කම්කරු දෙපාර්තමේන්තුව
කම්කරු ලේකම් කාර්යාලය, අංක 41, කිරුළ පාර,
කොළඹ 05, ශ්‍රී ලංකා.
0112 581 142-3-6
0112 581 148-9

සෞඛ්‍ය අමාත්‍යාංශය
සුවසිරිපාය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකා.
0112 675 449

ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග සහ කොවිඩ් රෝග
පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
සුවසිරිපාය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවන්ස හිමි මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකා.
0112 054 164

සමාජ සේවා දෙපාර්තමේන්තුව
2 වන මහල, අදියර II, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
0112 186 275

සර්වෝදය
ධම්සක් මන්දිරය, අංක 98, රාවතාවත්ත පාර, මොරටුව.
0112 647 159

සුමිත්‍රයෝ
60/7 හෝර්ටන් පෙදෙස, කොළඹ 07.
0112 682 535

# LAC මධ්‍යස්ථාන පිහිටි ස්ථාන

| | | | |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 011-2433618 | මන්නාරම | 023-2222045 |
| අක්කරෙයිපත්තු | 067-2279462 | මාරවිල | 032-2254443 |
| අම්පාර | 063-2223495 | මාතලේ | 066-2224828 |
| අනුරාධපුර | 025-2224465 | මාතර | 041-2233815 |
| අත්තනගල්ල | 033-2297020 | මතුගම | 034-2249262 |
| අවිස්සාවේල්ල | 036-2233857 | මාවනැල්ල | 035-2247272 |
| බද්දේගම | 091-2292051 | මිනුවන්ගොඩ | 011-2297790 |
| බදුල්ල | 055-2225759 | මොණරාගල | 055-2276891 |
| බලංගොඩ | 045-2289099 | ගල්කිස්ස | 011-2718708 |
| බලපිටිය | 091-2255753 | මුලතිවු | 021-2290077 |
| බණ්ඩාරවෙල | 057-2224733 | මුයිතූර් | 026-2238777 |
| බත්තරමුල්ල | 011-2877687 | නාවලපිටිය | 054-2224227 |
| මඩකලපුව | 065-2225399 | මීගමුව | 031-2281080 |
| චාවකච්චේරිය | 021-2270882 | නිකවැරටිය | 037-2260203 |
| හලාවත | 032-2222175 | නුගේගොඩ | 011-2809068 |
| දඹුල්ල | 066-2284551 | නුවරඑළිය | 052-2235260 |
| දෙයියන්දර | 041-2268077 | පානදුර | 038-2244822 |
| දෙනියාය | 041-2271128 | පේදුරුතුඩුව | 021-2260212 |
| ඇඹිලිපිටිය | 047-2230299 | පොල්ගහවෙල | 037-2243039 |
| ගල්ගමුව | 037-2253290 | පොළොන්නරුව | 027-2226572 |
| ගාල්ල | 091-2226124 | පොතුවිල් | 063-2248485 |
| ගම්පහ | 033-2248804 | පුගොඩ | 011-2405333 |
| හම්බන්තොට | 047-2221092 | රත්නපුර | 045-2226899 |
| හැටන් | 051-2222390 | තංගල්ල | 047-2240122 |
| හිඟුරක්ගොඩ | 027-2245521 | තඹුත්තේගම | 025-2276259 |
| හෝමාගම | 011-2748813 | තිස්සමහාරාමය | 047-2239611 |
| හොරණ | 034-2265244 | ත්‍රිකුණාමලය | 026-2226328 |
| යාපනය | 021-2224545 | වාලච්චේනයි | 065-2258349 |
| කඩවත | 011-2922440 | වව්නියාව | 024-2221863 |
| කඩුවෙල | 011-2548150 | වලස්මුල්ල | 047-2245566 |
| කැකිරාව | 025-2263536 | වැල්ලවාය | 055-2274466 |
| කල්මුනේ | 067-2223710 | වරකාපොළ | 037-2277075 |
| කළුතර | 034-2222017 | වාරියපොල | 037-2268199 |
| මහනුවර | 081-2388978 | වැලිමඩ | 057-2244860 |
| කන්තලේ | 026-2234521 | මල්ලකම් | 021-2059170 |
| කැබිතිගොල්ලැව | 025-2298101 | පුත්තලම් | 032-2266636 |
| කෑගල්ල | 035-2231790 | සියඹලාණ්ඩුව | 055-2279250 |
| කිලිනොච්චි | 021-2285618 | දෙහිඅත්තකණ්ඩිය | 027-2250700 |
| කුලියාපිටිය | 037-2284611 | LT-බොරැල්ල | 011-2698003 |
| කුරුණෑගල | 037-2229641 | ගලගෙදර | 081-2061025 |
| මහියංගනය | 055-2258332 | වත්තල | 011-2935907 |
| මාහෝ | 037-2275075 | හෙට්ටිපොල | 037-2291915 |

**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව**


නො.129, මහාධිකරණ සංකීර්ණය,
හල්ෆ්ට්ස්ඩෝර්ප් වීදිය, කොළඹ 12.

011 2433618

legalaidcommission1978@gmail.com

www.legalaid.gov.lk